DBT/PP/LKR-1

# VISA PREPAID SPEND / WEB CARD APPLICATION

COMMERCIAL BANK

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

(ශාඛාවේ නම)

දිනය

☐ VISA PREPAID SPEND CARD ☐ VISA PREPAID WEB CARD

CIF (ශාඛාවේ භාවිතය සඳහා පමණකි)

කාඩ්පත් අංකය: (ශාඛාවේ භාවිතය සඳහා පමණකි) | | | | | | X | X | X | X | X | X | X | X | X | | | | |

ප්‍රිය මහත්මයාණෙනි/මහත්මියනි,
මා පහත සඳහන් පහසුකම ලබාගැනීම සඳහා ඉල්ලුම් කරන අතර ඉල්ලුම් පත සකස් කිරීම සඳහා මාගේ විස්තර ඉදිරිපත් කරමි.

1. ☐ මයා ☐ මිය ☐ මෙනෙවිය ☐ පූජ්‍ය වෙනත් :

සම්පූර්ණ නම :
(ජා.හැ. ඇති ආකාරයට)

ජා.හැ.අ. :

කාඩ්පතෙහි නම සඳහන් විය යුතු ආකාරය:
(නම මුද්‍රිත කාඩ්පත් සඳහා පමණි)
(හිස් තැන්ද සහිතව අකුරු 24 කට සීමා විය යුතු අතර ජා.හැ.පතෙහි නම හා ගැළපිය යුතුය)

ලිපිනය :

දුරකථන අංකය (නිවස): දුරකථන අංකය (කාර්යාලය) දුරකථන අංකය (ජංගම)

උපන් දිනය : දිනය / මාසය / වර්ෂය

දෛනික මුදල් ගැනීමේ සහ අදාළ මිලදී ගැනීමේ සීමාව : ☐ රු.100,000/- රු.100,000/- ☐ රු.100,000/- රු.150,000/-

| PIN - පුද්ගලික හඳුනා ගැනීමේ අංකය | |
|---|---|
| ☐ SMS PIN | ☐ තැපැල් |

මම ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට සහතික වෙමි. සේවාවන් සැපයීම හා සබැඳි පසුපිටෙහි දක්වා ඇති කොන්දේසි සහ නියමයන් හොඳින් කියවා තේරුම්ගත් බවට මම තවදුරටත් සහතික වෙමි. එම කොන්දේසි සහ නියමයන්ටද, බැංකුව මඟින් ඕනෑම අවස්ථාවක ඒවාට සිදුකරන සංශෝධනයන්, ප්‍රභේදනයන් හෝ වෙනස්කිරීම් වලින්ද බැඳී සිටීමට මම එකඟ වෙමි.

ඔබගේ විශ්වාසී,

අත්සන

## සැලකිය යුතුයි :

Visa Prepaid / Web කාඩ්පත් සඳහා බඳවා ගැනීමේ ගාස්තුව රු.400/- කි. කාඩ්පත වලංගුවන්නේ වසර හතරක කාලයකට පමණි. කල් පිරුනු කාඩ්පතට නැවත අලුත් කාඩ්පතක් නිකුත් කරනු නොලැබේ. කාඩ්පත් හිමියා විසින් නව කාඩ්පතක් සඳහා අයදුම් කල යුතුයි. ගාස්තුවක් අයකරනු ලැබේ.

PIN අංකය සුරක්ෂිතව ලබා ගතිමි — අත්සන — දිනය

කාඩ්පත සුරක්ෂිතව ලබා ගතිමි — අත්සන — දිනය

ශාඛාවේ ප්‍රයෝජනය සඳහා පමණකි - බලයලත් නිලධාරියාගේ ප්‍රකාශය

**To Manager, Card Centre :-** *Signature verified, fees recovered and Operating instructions comply with the mandate.*

**Authorized Signature** **Date**

## නියමයන් සහ කොන්දේසි

කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී (බැංකුව) විසින් මගේ ඉල්ලීම අනුව, මට පහසුකම් ලබාදීම සැලකිල්ලට ගනිමින්, පහත සඳහන් නියමයන් හා කොන්දේසිවලින් බැඳීමට මම එකඟ වෙමි.

1. කාඩ්පත සෑම කල්හිම බැංකුව සතු දේපලක් වන අතර බැංකුව ඉල්ලා සිටි විටෙක කොන්දේසි විරහිතව වහාම එය බැංකුවට භාරදිය යුතු බව පිළිගැනීම.
2. මුදල් ආපසු ගැනීමට හෝ මිලදී ගැනීමකට මාගේ Prepaid Spend / Web කාඩ්පත් ගිණුමෙහි ප්‍රමාණවත් මුදලක් ඇතිවිටෙක මිස අන් කිසිම අවස්ථාවක කාඩ්පත භාවිත කිරීම හෝ භාවිත කිරීමට තැත් කිරීම නොකළ යුතුය.
3. කාඩ්පත් හිමියා පමණක් කාඩ්පත් භාවිතා කල යුතු අතර අන් අයකුට පැවරීම හෝ අන්සතු කල නොහැක.
4. කාඩ්පත අවලංගු කර හෝ භාවිතයෙන් ඉවත්කර ඇති බව බැංකුව හෝ බැංකුව වෙනුවෙන් පෙනී සිටින කෙනෙකු හෝ සිදුකරන දැන්වීමකින් පසුව එය භාවිත කිරීම හෝ භාවිත කිරීමට තැත් නොකළ යුතුය.
5. පුද්ගල හඳුනාගැනීමේ අංකය (PIN) / රහස්‍ය අංකය (Password) / පරිශීලක හඳුනාගැනීමේ කේතය (User ID) කිසිම අවස්ථාවක මොනම හේතුවක් නිසා හෝ කිසිම පුද්ගලයෙකුට හෙළි නොකිරීම සහ එය අතිශයින්ම රහස්‍ය ලෙස සැලකීම.
6. කාඩ්පත අස්ථානගත වුවහොත් හෝ සොරකම් කරනු ලැබුවහොත් වහාම බැංකුවට දැන්වීම සහ පරිශීලක හඳුනාගැනීමේ කේතය / රහස්‍ය අංකය / පුද්ගල හඳුනාගැනීමේ අංකය අවසර නොලත් පාර්ශවයක් අතට පත්වී ඇති බව දැනගතහොත් වහාම බැංකුවට වාර්තා කිරීම.
7. 6 වෙනි කොන්දේසිය හා බැඳේ, සියලු ගිණුම හා සිදුවන කාඩ්පත් ගනුදෙනු හා ඊට අදාල ගාස්තු, මාගේ ගිණුම හර කර ගිණුම මඟින් ලබා ගැනීමට අනුමැතිය ලබා දෙයි.
8. ATM හෝ CRM වලින් පෙන්වන ශේෂය ඔබගේ කාඩ්පතෙහි පවතින ශේෂය සමඟ වෙනස් විය හැකිය.
9. ATM/ CRM යන්ත්‍රයේ ප්‍රමාණවත් මුදල් නොමැතිවීම ඇතුලු ඕනෑම පහසුකමක් ක්‍රමානුකූලව ක්‍රියා නොකිරීම හෝ ක්‍රියාකිරීමට අසමත්වීම හේතු කොටගෙන සිදුවන කිසිදු පාඩුවක් හෝ හානියක් සඳහා වන වගකීමෙන් හෝ චෝදනාවෙන් බැංකුව නිදහස් කිරීම.
10. ඉහත අංක 9 වෙනි කොන්දේසිය හා බැඳේ. එයට අදාලව කාඩ්පත හරහා සිදුකෙරෙන ගනුදෙනු මා විසින් වගකියනු ලබන අතර ගනුදෙනු හා බැඳුනු සියලු වගකීම් මා විසින් බාරගනු ලැබේ.
11. කිසියම් හේතුවක් නිසා කාඩ්පත අගරු වුවහොත් ඒ පිළිබඳව බැංකුව වගකිවයුතු නොවේ.
12. කුමන හේතුවක් මත හෝ කාඩ්පත භාවිතය තවදුරටත් අවශ්‍ය නොවන්නේ නම් කාඩ්පත අවලංගු කිරීම සඳහා බැංකුවට ආපසු ලබාදිය යුතුය.
13. මට පූර්ව දැනුම් දීමකින් තොරව පහසුකම් නැවැත්වීමට / අවලංගු කිරීමට / අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට බැංකුවට නිදහස ඇත.
14. Prepaid Web / Spend කාඩ්පත් වලින්, ශ්‍රී ලංකා රුපියල් වලින් හැර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල් වලින් සිදුකරන ගනුදෙනු සඳහා විනිමය අනුපාතයන් එම ගිණුමට (Prepaid Web / Spend) බැර කරනු ලබන්නේ VISA International ආයතනය විසින් එම ගනුදෙනුව සිදුකල දිනයට, VISA International ආයතනය විසින් ලබාදෙන විනිමය අනුපාතය සහ එම ගනුදෙනුවට අදාළ යම් විශේෂ ගාස්තුවක් වේ නම් එම ගාස්තුද ඇතුලත්වය.
15. ඉඩම් නිවාස හෝ විදේශීය මූල්‍ය වත්කම් මිලදී ගැනීමට මෙම කාඩ්පත භාවිත නොකරන බවට මා/අප සහතික වෙමි/වෙමු.
16. බැංකුව විසින් කාඩ්පත භාවිත කිරීමේදී පනවන ලද නියමයන් හා කොන්දේසි වලට අමතරව VISA මඟින් කාඩ්පත් භාවිත කිරීමේදී පනවා ඇති නියමයන් හා කොන්දේසි වලට කාඩ්පත් හිමියා යටත් වේ.
17. මෙම නියමයන් හා කොන්දේසි වෙනස් කිරීමේ අයිතිය බැංකුව සතුයි.

මෙම ප්‍රකාශය ශ්‍රී ලංකාවේ අධ්‍යක්ෂ -
විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ

මම ______

(ප්‍රාථමික කාඩ්පත් හිමිකරු) ______

(ප්‍රාථමික කාඩ්පත් හිමිකරු) මෙහි ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. කාඩ්පත/පත් මගින් විදේශ විනිමය හා සම්බන්ද ගනුදෙනු කිරීමේ දී බලපැවැත්වෙන, විදේශ විනිමය පනතට අදාළ වූ 17.11.2017 වන දින පළ වූ අංක 2045/56 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ සඳහන් කොන්දේසි පිළිබඳව මා දැනුවත්ව ඇති බවත් එම කොන්දේසිවලට යටත්ව කටයුතු කිරීමටත් සහතික වෙමි. විදේශ විනිමය පනත ප්‍රකාරව, කොමර්ෂල් බැංකුව විසින් නිකුත් කරන ලද කාඩ්පත/පත් වලින් විදේශ විනිමය හා සම්බන්ධ මා විසින් සිදු කරනු ලබන ගනුදෙනුව/ගනුදෙනු පිළිබඳව කොමර්ෂල් බැංකුවට අවශ්‍ය තොරතුරු සැපයීමට මම තවදුරටත් එකඟ වෙමි. මම ශ්‍රී ලංකාවෙන් සංක්‍රමණය වීමේ දී හෝ විදේශ සේවා නියුක්තිය සඳහා ඉන් බැහැර වී යාමට සිදුවන අවස්ථාවක දී මා විසින් දරන්නා වූ ක්‍රෙඩිට් කාඩ්පත/පත් බැංකුව වෙත පවරාණය කරන බවට මම තවදුරටත් සහතික වෙමි.

මා හට නිකුත් කරන ලද EFTC (ඉලෙක්ට්‍රොනික මුදල් හුවමාරු කාඩ්පත්) මඟින් අවසර නොලත් විදේශ විනිමය ගනුදෙනු සිදුවන බවට සාධාරණ හේතු මත පදනම් වූ සැකයක් මත බලයලත් නියෝජිතයා හට, එම විදේශ විනිමය නැවැත්වීමට කටයුතු කිරීම අවශ්‍ය බව මම දනිමි.

**I confirm that the above declarations have been read and understood.** |
ඉහත සඳහන් ප්‍රකාශය හා ක්‍රෙඩිට් කාඩ්පත්‍රධාරී නියමයන් සහ කොන්දේසි මා හොඳින් කියවා තේරුම් ගන්නා ලදී.

மேலே தெரிவிக்கப்பட்டுள்ள விபரங்களையும் கிரெடிட் கார்ட் தொடர்பான விதிகள், நிபந்தனைகளையும் நான் நன்கு வாசித்து கொண்டேன்.

______

අයදුම්කරුගේ අත්සන